# ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# උපකුලපති තනතුර සඳහා අයදුම්පත්‍ර කැඳවීම

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 34 වන වගන්තියේ සහ එහි පසු සංශෝධන නියමන් පරිදි ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් උපකුලපති තනතුර සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් (ශ්‍රී ලාංකික පුරවැසියන් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට වයස අවුරුදු 63ට අඩු විය යුතුය.) අයදුම්පත් කැඳවනු ලැබේ.**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත ප්‍රකාරව උපකුලපතිවරයා පූර්ණ කාලීන නිලධාරියකු වන අතර, ඔහු එහි ප්‍රධාන විධායක නිලධාරියා ද, ප්‍රධාන අධ්‍යයන නිලධාරියා ද හා ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා ද වේ. ඔහු නිල බලයෙන් පාලක සභාවේ හා සනාතන සභාවේ සාමාජිකයෙක් මෙන්ම සභාපතිවරයා ද වේ.

1978 අංක 16 දරන සංශෝධිත විශ්වවිද්‍යාල පනත ප්‍රකාරව උපකුලපති සේවය අත්හැරිය හොත් හෝ තනතුරින් කලින් ඉවත් කළහොත් හෝ හැර වසර තුනක කාලයක් සඳහා පත් කරනු ලබන අතර, ඔහු/ ඇය වයස අවුරුදු 65 සම්පූර්ණ වනතුරු හෝ උපකුලපති තනතුරේ කාලය අවසන් වනතුරු හෝ යන දෙකෙන් පූර්වයෙන් එළඹෙන දිනය තෙක් සේවය කළ යුතු වේ.

උපකුලපතිවරයා අධ්‍යයන කටයුතු මෙහෙය වීම, කළමනාකරණ ප්‍රතිපත්ති හඳුන්වා දීම හා පාලක සභාවේ තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු වේ. ඔහු / ඇය විශ්වවිද්‍යාල සාමාන්‍ය පරිපාලන, අධ්‍යයන විශිෂ්ටත්වය, පාරදෘශ්‍ය භාවය, වගකීම, ප්‍රජාතාන්ත්‍රික කළමනාකරණය හා සඵල අපක්ෂපාතී නායකත්ව මූලධර්ම උත්ථම්භනය කළ යුතු වේ.

තම ප්‍රබල පර්යේෂණ වාර්තාවක්, ප්‍රත්‍යක්ෂ නායකත්ව ගුණාංග හා විවිධ අභිරුචි කණ්ඩායම් සමග වාස්තවික ගනුදෙනු කළ හැකි අන්තර් පුද්ගල නිපුණතා, ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් පැහැදිලි අවබෝධයක් හා තීරණ සඵල පරිදි ක්‍රියාත්මක කිරීමේ කැපවීම ඇතුළු උසස් අධ්‍යයන ජයග්‍රහණ සාර්ථක අපේක්ෂකයා සතුව තිබිය යුතු වේ. ප්‍රජාව කෙරෙහි කැපවීම ඇතුළු විශ්ව විද්‍යාලයෙහි දැක්ම හා මෙහෙවර පිළිබඳව ගැඹුරු අවබෝධයක් ඔහු / ඇය සතුව තිබිය යුතුයි. ( සුදුසු අයදුම් කරුවන්ට ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවියට (https://www.sab.ac.lk) පිවිසීමෙන් සහ උපකුලපති තනතුර සඳහා නිර්දේශ කිරීමට අදළ 2023.04.10 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 03/2023 හි සඳහන් කර ඇති මාර්ගෝපදේශය මගින් ද මේ සම්බන්ධයෙන් වැඩිදුර විස්තර ලබාගත හැකිය.)

**උපකුලපතිවරයා මේ අනුව පහත සඳහන් අනෙකුත් දීමනා සහ ප්‍රතිලාභ ද ඇතුළුව ඉහළ ම අධ්‍යයන කාර්යමණ්ඩල වැටුප් පරිමාණය සඳහා සුදුසුකම් ලබයි.**

- අංග සම්පූර්ණ නවාතැන් පහසුකම්
- මසකට මුළු ඉන්ධන ලීටර් 145 ක දීමනාවක් සමග නිල රථය
- මසකට රුපියල් 6,000/- ක උපරිමයක් දක්වා දුරකථන බිල්පත් ප්‍රතිපූරණය කිරීම
- මූලික වැටුපෙන් 15% ක සංග්‍රහ දීමනාව

අයදුම්පත් සමග පහත සඳහන් ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතු වේ.

(1) **උපන් දිනයද** ඇතුළත්ව අයදුම්කරුවාගේ සම්පූර්ණ ජීව දත්ත තොරතුරු පත්‍රිකාවක්

(ii) විශ්වවිද්‍යාලයේ අභිවර්ධනය සඳහා ස්වකීය දැක්ම පිළිබඳ ප්‍රකාශයක්, උපකුලපති තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඉටු කිරීමට යෝජිත කාර්යයන් පිළිබඳ කෙටි විස්තරයක්

(iii) ඉහත ii හි සඳහන් ලිපි ලේඛනවලට අමතරව, අයදුම්කරුවා වර්තමාන උපකුලපති තනතුර දරන්නේ නම් හෝ මෙම විශ්වවිද්‍යාලයේ උපකුලපති තනතුර හොබවා ඇත්නම් ඔහුගේ / ඇයගේ ධුර කාලයේ ලබා ගත් ජයග්‍රහණ ඉස්මතු කරමින් වාර්තාවක්

(iv) අයදුම්කරුවා රාජ්‍ය සේවය, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය හැර වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක සේවයේ නිරත වන්නේ නම් එකී අයදුම්කරු තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි බවට සේවා යෝජකයාගෙන් ලිපියක්

අයදුම්පත්‍ර 2023. 06.30 වන දින පස්වරු 3.30 ට හෝ ඊට පෙර **"සමන් උයන්ගොඩ, ලේඛකාධිකාරී හා පාලක සභාවේ ලේකම්, ලේඛකාධිකාරී කාර්යාලය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, තැ.පෙ 02, බෙලිහුල්ඔය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ වැඩ කරන දිනයක ලේඛකාධිකාරී කාර්යාලයට පෞද්ගලිකව පැමිණ භාර දීම සිදු කළ යුතුය. අයදුම්පත්‍ර බහාලන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ **"උපකුලපති තනතුර"** ලෙස සඳහන් කළ යුතු වේ. මෙයට අමතරව, අයදුම්පත සහ අදළ ලිපි ලේඛනවල මෘදු පිටපත් PDF ආකාරයෙන් registrar@sab.ac.lk විද්‍යුත් ලිපිනය මගින් ඉහත සඳහන් දිනට හෝ ඊට පෙර ලේඛකාධිකාරී කාර්යාලයට ලැබීමට සැලැස්විය යුතුය.

අයදුම්පත් භාර ගැනීමේ අවසන් දින සිට මාස දෙකක් ඇතුළත උපකුලපති තනතුර සඳහා සියලු අයදුම්කරුවන් පාලක සභාවේ ඇගයුම් හා සම්මුඛ පරීක්ෂණයක් සඳහා අවම වශයෙන් විනාඩි දහයක (10) නමුත් විනාඩි පහළොවක් (15) නොඉක්මවන සංක්ෂිප්ත ඉදිරිපත් කිරීමක් සඳහා විශේෂ පාලක සභා රැස්වීමකට කැඳවනු ලැබේ. යම් විශේෂ තත්ත්වයක් මත අයදුම්කරුවෙකුට භෞතිකව පැමිණිය නොහැකි නම් ලේකම්වරයාට පූර්ව දැනුම්දීමක් කිරීමෙන් පසුව ඔහු/ඇයට වීඩියෝ තාක්ෂණය ඔස්සේ සහභාගි විය හැක. කිසිදු වෙනත් අයදුම්කරුවෙකුට, පාලක සභාවේ සාමාජිකයෙකු වුවද පාලක සභා රැස්වීම් ස්ථානයේ රැඳී සිටීමට හෝ වෙනත් අයදුම්කරුවන්ගේ ඉදිරිපත් කිරීම්වලට සවන් දීමට අවසර නොලැබේ.

2023.04.10 දිනැති විශ්වවිද්‍යාල කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 03/2023 කොමිෂන් සභා චක්‍රලේඛයේ දක්වා ඇති නිර්ණායක හත, සංරචක හා ක්‍රියාපටිපාටිවලට අනුකූලව සියලු පාලක සභා සාමාජිකයින් 0-10 ලකුණු පරිමාණයට සියලු අයදුම්කරුවන් පිළිබඳව පෞද්ගලික තක්සේරුවක් සිදු කරනු ඇත.

පාලක සභාවේ සෑම සාමාජිකයෙකු විසින් ම අයදුම්කරුවන්ට අදළ නිර්ණායක හත යටතේ ලබා දී ඇති සමස්ත ලකුණුවල මධ්‍යස්ථය ගණනය කිරීමෙන් අයදුම්කරුවන්ගේ මුළු ලකුණු ගණනය වේ.සියලු පාලක සභා සාමාජිකයින් විසින් අත්සන් කරනු ලැබූ අවසන් ලකුණු ලබා ගත් පිළිවෙළ අනුව අයදුම්කරුවන් තිදෙනෙකුගේ නම් ලැයිස්තුවක් සමඟ විශේෂ පාලක සභා රැස්වීමේ වාර්තාව , සියලු පාලක සභා සාමාජිකයින් විසින් අත්සන් කරනු ලැබූ අදළ තිදෙනාගේ ලකුණු ද සමඟ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 34 (1) වගන්තියට අනුකූලව හා විශ්වවිද්‍යාල කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලැබූ ඉහත චක්‍රලේඛයේ සඳහන් ක්‍රියාපටිපාටියට අනුකූලව අදළ පත්වීම සඳහා සලකා බැලීමට විශ්වවිද්‍යාල කොමිෂන් සභාව වෙත යවනු ලැබේ.

**සමන් උයන්ගොඩ,**
**ලේඛකාධිකාරී හා පාලක සභාවේ ලේකම්,**
**ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය,**
**බෙලිහුල්ඔය.**
**2023.04.30**